**හොරොව්පොතාන ප්‍රාදේශීය සභාව**

**අනුරාධපුර දිස්ත්‍රික්කය**

**-----------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**-----------------**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

**----------------------------------**

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2015 ජූනි 08 දිනද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2014 මැයි 19 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2015 ජූලි 11 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

**1.2 මතය**

**---------**

මෙම වාර්තාවේ 1.3 ජේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර , මූල්‍ය ප්‍රකාශන වලින් 2014 දෙසැම්බර් 31 දිනට හොරොව්පොතාන ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**---------------------------------------**

**1.3.1** ගිණුම්කරණ අඩුපාඩු.

-------------------------

**(අ)** සමාලෝචිත වර්ෂයේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ වාණිජ ස්ථාන 12 ක් රු.3,098,600 කට බදුදීම සිදුකර තිබුණු අතර, මූල්‍ය ප්‍රකාශනවල බදු ආදායම රු.2,331,266 ක් ලෙස දක්වා තිබුණු බැවින්, රු.767,334 ක් අඩුවෙන් දක්වා තිබුණි.

**(ආ)** සමාලෝචිත වර්ෂයේදී සභාව වෙත ලැබී තිබුණු රු.10,218,160 ක් වූ වාහන 03 ක වටිනාකම සහ වටිනාකම තහවුරු කර නොගත් වාහන 02 ක වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි

(ඇ) සමාලෝචිත වර්ෂයේ විගණන ගාස්තු තක්සේරු කර මූල්‍ය ප්‍රකාශන වල ප්‍රතිපාදන සලසා නොතිබුණි.

(ඈ) 2010 වර්ෂයේ ගිවිසුම් අත්සන් කළ නමුත්, සමාලෝචිත වර්ෂය දක්වා එම ගිවිසුම් ප්‍රකාරව ඉටුකර නොතිබුණු කර්මාන්ත 23 ක රු.13,939,312 ක් වූ ගිවිසුම්ගත වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල කර්මාන්ත ණයගැතියන් සහ ණයහිමියන් ලෙස දක්වා තිබුණි.

(ඉ) 2003 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා කාලපරිච්ඡේදයේ ටෙන්ඩර් ප්‍රදානයන් භාරගැනීම ප්‍රතික්ෂේප කර තිබුණු ටෙන්ඩර්කරුවන් 20 දෙනෙකු ඉදිරිපත් කර තිබුණු රු.1,134,000 ක ටෙන්ඩර් ඇප තැන්පත් ආදායමට ගෙන නොතිබුණි.

**1.3.2 විගණනය සඳහා සාක්ෂි නොවීම.**

---

එකතුව රු.91,774,614 ක් වු වත්කම් හා වගකීම් ගිණුම් විෂයයන් 12 ක් සම්බන්ධයෙන් අයිතිය තහවුරු කිරීමේ ලියවිලි/ පැවැත්ම තහවුරු කිරීමේ ලියවිලි/ විස්තරාත්මක උපලේඛන විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

**02 මූල්‍ය සමාලෝචනය.**

---

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

---

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ මෙහෙයුම් අතිරික්තය රු.1,071,814 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ මෙහෙයුම් අතිරික්තය රු.78,947 ක් විය.

**2.2 ආදායම් පරිපාලනය.**

---

**2.2.1 වරිපනම් බදු**

---

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134(1) වගන්තිය ප්‍රකාරව දියුණු කළ ප්‍රදේශ වශයෙන් ප්‍රකාශයට පත් කරන ලද බල ප්‍රදේශය ඇතුළත පිහිටියා වූ දේපලවල වාර්ෂික වටිනාකම මත වරිපනම් බද්දක් පැනවීමට කටයුතු කර නොතිබුණි.

**2.2.2 බදුකුලී**

---

2014 දෙසැම්බර් 31 දිනට එකතුව රු.1,373,330 ක්වූ හිඟ කඩකාමර කුලී අදාල පාර්ශ්වයන් නොමැතිවීම හේතුවෙන් අයකර ගැනීම අවිනිශ්චිත තත්ත්වයක පැවතුණි.

**2.2.3 බලපත්‍ර ගාස්තු**

**-----------------**

හඳුනා නොගත් කාලපරිච්ඡේදයක සිට බල ප්‍රදේශයේ වෙළඳ ආයතන 284 කින් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයවිය යුතුව තිබුණු වෙළඳ බලපත්‍ර ගාස්තුව රු.1,043,750 ක් වූ අතර, මෙම වෙළඳ ආයතනවල වර්තමාන පැවැත්ම තහවුරු වී නොමැති බැවින්, හිඟ මුදල් අයකර ගැනීම අවිනිශ්චිත තත්ත්වයක පැවතුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

------------------------------

**3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

**------------------------------**

**(අ)** පළාත් පාලන ප්‍රතිසංස්කරණ චක්‍රලේඛ අංක 03 ප්‍රකාරව 2013 දෙසැම්බර් 31 දිනට සභාව සතු ඉඩම්වල අයිතිය සභාව වෙත පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

**(ආ)** අංක PL/09/1/16 දරන පළාත් පාලන ප්‍රතිසංස්කරණ චක්‍රලේඛ අංක 6 හි දැක්වෙන පරිදි සභා බලප්‍රදේශය තුළ පිහිටි සියළුම මාර්ග හඳුනාගෙන නිසි පිළිවෙලකට ලැයිස්තුගත කර ලේඛන පිළියෙල කර නොතිබුණු අතර, සභාවට අයත් සියළුම මාර්ග ගැසට් පත්‍රයේ පළ කර ප්‍රකාශයට පත්කර නොතිබුණි.

**(ඇ)** දීර්ඝ කාලයකට පෙර සභාව වෙත ලැබී තිබුණු අත්ට්‍රැක්ටරය හා ට්‍රේලරයක් (203 වන අධිකාරය) මෝටර් වාහන පනතේ 2(1) වගන්තියේ විධිවිධාන වලට පටහැනිව 2014 දෙසැම්බර් වන විටත් ලියාපදිංචි නොකර ධාවනය කරමින් පැවතුණි.

**(ඈ)** 2006 අංක 12 දරන මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනතේ 3 වන වගන්තිය ප්‍රකාරව සභාව විසින් එකතු කරනු ලබන වෙළඳ බලපත්‍ර ගාස්තුවෙන් සියයට 10 ක මුද්දර බද්දක් අයකර දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්ට ප්‍රේෂණය කළයුතු වුවත්, සමාලෝචිත වර්ෂය තුළ සභාව විසින් අයකර තිබුණු රු.845,940 ක් වූ බලපත්‍ර ගාස්තු මත රු.84,594 ක් වූ මුද්දර ගාස්තු සම්බන්ධයෙන් එපරිදි කටයුතු කර නොතිබුණි.

**(ඉ)** 2004 ජනවාරි 26 දිනැති ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ උපදේශක චක්‍රලේඛ අංක 2004/ප්‍රස/01 ප්‍රකාරව සභාව විසින් පවත්වාගෙන යන පුස්තකාලය සතු පොත්පත්, සඟරා, පුවත්පත් සහ අනෙකුත් පුස්තකාල ද්‍රව්‍ය හා උපකරණ සම්බන්ධව සමීක්ෂණයක් කලයුතු වුවද සමාලෝචිත වර්ෂය අවසානයේදී එවැනි සමීක්ෂණයක් පවත්වා නොතිබුණි.

**3.2 නිෂ්ක්‍රීය සහ ඌණ උපයෝජිත වත්කම්.**

**----------------------------------------------**

සභාව සතු වාහන 06 ක් හා ට්‍රැක්ටර් ට්‍රේලර් 02 ක් ප්‍රයෝජනයට නොගෙන සභා භූමියේ දිරාපත් වෙමින් පැවති අතර, එම වාහන අලුත්වැඩියා කර ප්‍රයෝජනයට ගැනීමට හෝ අපහරණය කර සභාවට ආදායමක් ලබාගැනීමට හෝ කටයුතු කර නොතිබුණි.

**3.3 හඳුනා ගත් අලාභ**

**--------------------**

පූර්ව වර්ෂවලදී පොකුණු ඉදිකිරීම් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ දී සහ 2012 වර්ෂයේ මස්කඩ බදු දීමේදී ප්‍රාදේශීය සභාව විධිමත්ව කටයුතු කර නොතිබීම නිසා සභාවට එරෙහිව පැවරී තිබුණු නඩු වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී රු.218,015 ක නීතිඥ ගාස්තු වැයකර තිබුණු අතර, අනුරාධපුර මහාධිකරණයේ නඩු තීන්දුවක් අනුව අගතියට පත් පාර්ශවයක් වෙනුවෙන් රු.325,176 ක් ගෙවීමට සිදුවී තිබුණි.

**4. පද්ධති හා පාලනය**

**------------------------**

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

**(අ)** ගිණුම්කරණය

**(ආ)** ආදායම් පරිපාලනය.

**(ඇ)** වත්කම් කළමනාකරණය